# ක්‍රි. පූ. තෙවැනි සියවසේ මෞර්ය ශ්‍රී ලංකා සබඳතාවල අභිලාෂ පිළිබඳ විමසුමක්

An inquiry into the Aspirations of mauryan - Sri Lanka Relations in the Third Centuty B.C.

කුඩාවැවේ සෝමානන්ද හිමි

**Abstract**

The purpose of this research is to show the ancient Buddhist history of Sri Lanka and relationships with Mauryan emperor of India in 3rd century B.C. depicted in primary litereary and archaeology sources. Aṭṭhakatha refers to Pali-language Theravada Buddhist commentaries to the canonical Theravada Tipitaka. They provide information on the History of Sri Lanka from about the 6th century BCE. And, the Pali chronicles as well as a large collection of stone inscriptions, the Indian Epigraphical records etc. gives facts on the History of Sri Lanka. This research will explore the facts of utilizing those historical sources for the research and interpretation of the History of Sri Lanka.

**Key Words:** Sri Lanka, Mauryan Emperors, King Devanam Piyatissa, Arahath Mahinda, Arahath Sangamitta

**සාරසංක්ෂේපය**

ඉපැරණි ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසයත් මෞර්ය අධිරාජ්‍යයත් අතර පැවැති සබඳතා පිළිබඳ ප්‍රාථමික සාහිත්‍යය මූලාශ්‍රවල හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවල නිරූපනය වන අයුරු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. අට්ඨකථා සාහිත්‍ය, පාලි වංසකථා හා අභිලේඛන මූලාශ්‍ර මගින් ක්‍රි. පූ. හයවැනි සියවසේ සිට ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සපයයි. ඉහත සඳහන් මූලාශ්‍ර භාවිත කර ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ මෙම පර්යේෂණයෙන් වැඩිදුරට අධ්‍යනය කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ශ්‍රී ලංකාව, මෞර්ය අධිරාජ්‍යවරු, දේවානම්පියතිස්ස රජු, මහින්ද මහරහතන් වහන්සේ,සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ

**හැඳින්වීම**

ක්‍රි. පූ. 6 වැනි සියවසේ උතුරු ඉන්දියාවේ පහළ වූ ශාස්තෘවරයෙකු වූ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය ඉන්දියාවට පමණක් සීමා නොවීය. එම ධර්මය විවිධ කාලපරිච්ඡේදවල ආසියාවේ බොහෝ රාජ්‍යයන්හි ව්‍යාප්ත විය. අග්නිදිග ආසියාවේ බුරුමය, වියට්නාමය, ලාඕසය, සියමය, කම්පුජියාව, මැලේසියාව, ඉන්දුනිසියාව, සුමාත්‍රා හා ජාවා ආදී රාජ්‍යන් ද නැගෙනහිර ආසියාවේ චීනය, කොරියාව හා ජපානය වැනි රාජ්‍යන් ද පෙන්වාදිය හැකිය. ඒ හැර ඉන්දියාවට උතුරු දෙසින් පිහිටා ඇති ටිබෙට් දේශයේත් මධ්‍යම ආසියාව හරහා චීනය තෙක් වැටී තිබුණු ඉපැරණි තවලම් මාර්ගය ආශ්‍රිතව බිහි වූ රාජ්‍යයන් ගණනාවකත් බුදුදහම ව්‍යාප්ත වී ගිය අයුරු පැහැදිලිව පෙනෙයි. මෙලෙස බුදුදහම පැතිරී ගිය රාජ්‍යයන් අතරින් ශ්‍රී ලංකාවට සුවිශේෂී තැනක් හිමි වේ.

**සාහිත්‍ය විමර්ශනය**

ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය පිහිටුවීම මේ රට ඉතිහාසයෙහි සුවිශේෂී සංදිස්ථානයක් යැයි කිවහැකිය. ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ දී මෞර්ය ශ්‍රී ලංකා සබඳතාවල ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත කණ්ඩායමේ මෙහෙය වීම මත බුදුදහම ඉතාම කෙටිකාලයකින් මෙරට ව්‍යාප්ත වී ස්ථාපිත වූ අයුරු ශ්‍රී ලාංකේය වංසකථා, අට්ඨකථා ආදී මූලාශ්‍රයන්හි සවිස්තරාත්මකව දැක්වෙයි. එම මූලාශ්‍රයන්හි දැක්වෙන්නේ තත් අවධියෙහි ලංකාවේ පාලකයන් ඉන්දීය මෞර්ය ආධිරාජ්‍යයට අයත් පාලකයන් සමඟ පැවති සබඳතා, එවක මෙරට පැවැති ආගමික පරිසරය, අනුරාධපුර පාලක තිස්ස හා අශෝක අධිරාජ්‍යයා අතර වූ සබඳතාවය, රාජකීය පවුලේ සාමාජිකයන් බුදුදහම වැළඳ ගැනීම, මිහිඳු හිමියන්ගේ කාර්යභාරය, මෙරට එවක ඉදිවූ ප්‍රධාන ආගමික ගොඩනැගිලි, විශේෂයෙන් සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ඇතුළු ශිල්ප ශ්‍රේණීන්ගේ පැමිණීම සහ මහමෙවුනා උයනෙහි ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාව රෝපණය

කිරීම, මෙහෙණි සසුන පිහිටුවීම යනාදියයි. දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකා බාහිර නිදාන වණ්ණනා මෙන්ම වංසත්ථප්පකාසිනි යන මූලාශ්‍රයන් තුලනාත්මකව පරීක්ෂණයට බඳුන් කරමින් ඒවායේ දැක්වෙන ඓතිහාසික සාධක මත ක්‍රි. පූ. තෙවැනි සියවසේ ලංකාව හා ඉන්දියාව අතර පැවැති සබඳතා ගැන හැඳෑරීමට හැකිය.

**පර්යේෂණ ගැටළුව**

ක්‍රි. පූ. තෙවැනි සියවසේ ශ්‍රී ලංකාව හා මෞර්යයන් අතර පැවැති සබඳතා යහපත් ස්වරූපයක් ගත් බවත් ඒ සඳහා බුදුසමයෙහි භාවිතය පිළිබඳවත් මෙම පර්යේෂණයේ දී සාකච්ඡාවට ලක්කෙරේ. ඒ අනුව පහත සඳහන් ගැටළු මෙම පර්යේෂණයේ දී සැලකිල්ලට භාජනය වේ.

1. ක්‍රි. පූ. තෙවැනි සියවසේ පැවැති ආගමික සබඳතාවන්හි ස්වරූපය කෙසේවීද?

2. මෞර්ය ශ්‍රී ලංකා සබඳතා කෙරෙහි බලපෑ හේතු සාධක මොනවාද? යන්නයි.

**පර්යේෂණයේ අරමුණු**

මෙම පර්යේෂණයේ දී ක්‍රි. පූ. තෙවැනි සියවසේ ශ්‍රී ලංකාව හා මෞර්යයන් අතර පැවැති සබඳතාවයේ ස්වරූපය අධ්‍යයනය කෙරේ. එහෙයින් පහත සඳහන් අරමුණු ඔස්සේ මෙම පර්යේෂණය සිදුකෙරේ.

1. ඓතිහාසික මූලාශ්‍ර අනුසාරයෙන් මෞර්ය ශ්‍රී ලංකා සබඳතාවන්හි ස්වරූපය පරීක්ෂා කිරීම

2. ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර පැවැති සංස්කෘතික සබඳතා ස්මතු කොට දැක්වීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ දී භාවිත ප්‍රධාන ක්‍රමවේදය වන්නේ

සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර භාවිතයයි. මෙහිදි ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් භාවිත ප්‍රධාන මූලාශ්‍ර වන්නේ දීපවංශය, මහාවංසය, සමන්තපාසාදිකාව යන කෘතීන් වන අතර ඉන් ශ්‍රී ලාංකේය ඓතිහාසික සම්ප්‍රදාය අවබෝධ කර ගැනීමට එළියක් සපයනවා මෙන් ම ඉතිහාස වාර්තාවල ස්වරූපය පිළිබඳව හැඟීමක් ද ඇති කරවයි.

**පර්යේෂණයේ වැදගත්කම**

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පැවැති සබඳතා පිළිබඳව ප්‍රාථමික මූලාශ්‍ර ඇසුරෙන් දැනට ස්ථාපිතව පවත්නා දැක්ම සැලකිය යුතු අන්දමින් විමසීමට ඓතිහාසික සාධක ඔස්සේ ප්‍රයත්න දරයි. එහිදී විශේෂ අවධානය යොමු කෙරෙන්නේ උතුරු ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ක්‍රි. පූ. තෙවැනි සියවසේ මෞර්යයන් සමග පැවති සබඳතාව කෙරෙහිය. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පැවති සබඳතාව පොදුවශයෙන්ද, ශ්‍රී ලංකාව සමග වඩාත් සමීපව මෞර්ය රාජ්‍ය සමග පවත්වා ගෙන ගිය සබඳතා විශේෂයෙන් ද නව දෘෂ්ටිකෝණයකින් දැක්මට අවස්ථාව උදාකෙරේ. ශ්‍රී ලංකාවේ වංසකතාවලින් ඉස්මතුවෙන ආකල්පය එලෙස පිළිගැනීම ශාස්ත්‍රීය ඉතිහාස ගවේශනයේ දී උචිත නොවේ. ශ්‍රී ලංකාව හා මෞර්යයන් අතර පැවැති සබඳතාව යථා පරිදි දැකීමට අවශ්‍යයෙන්ම පුණරීක්ෂණයට ලක්කළ යුතු බව මතු කරයි.

**සාකච්ඡාව**

ක්‍රි. පූ. තෙවැනි සියවස ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් යැයි සඳහන් කළ හැකිය. මෞර්ය පාලක අශෝක අධිරාජයාගේ ප්‍රමුඛත්වයෙන් බුදුදහම හඳුන්වාදීම සංස්කෘතිකමය පාර්ශ්වයෙහි සුවිශේෂත්වය සනිටුහන් කරනු ලැබේ.[1] මෙම අවධියේ මෞර්ය ශ්‍රී ලංකා සබඳතා පාලන සංවිධානයේ මෙන්ම පාලන නායකත්වයෙහි ද හැඩගැසීම උදෙසා ඍජුවම බලපෑවේය. එය අභිලේඛන මඟින් ද පෙනීයයි. අශෝක අධිරාජයා ඉන්දීය ප්‍රදේශයන් මෙන්ම ඉන් පරිබාහිර වෙනත් රාජ්‍යය පාලකයන් සමඟ ද සබඳතාවයන් ගොඩනගාගත් අයුරු ඔහුගේ අභිලේඛනයන් මඟින් පෙනීයයි.[2] ඒ අනුව ස්වකීය මිත්‍රයෙකු වූ එවක මෙරට පාලකයා දේවානම්පිය තිස්ස සමඟ ඔහු විසින් සබඳතාවයන් ගොඩනගාගනු ලැබීය.[3] අශෝක ලිපිවල සහ

වෙනත් දේශීය සාහිත්‍යය මූලාශ්‍රවල තිබෙන තම්බපණ්ණි යන්න ශ්‍රී ලංකාවම බව පැහැදිලිය.[4] අශෝකයන්ගේ 13 වැනි ගිරි ලිපියෙන් පෙනීයනු ලබන්නේ තම ධර්මමහාමාත්‍රවරු උපයෝගි කොටගෙන ශ්‍රී ලංකාවේ අශෝක ධර්මය සම්බන්ධයෙන් සාධනීය පරිසරයක් මහින්දාගමනයට පෙර සිටම සකස්කරනු ලැබූ බවය.[5]

තුන්වැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් විවිධ ප්‍රදේශයන් කරා ධර්මදූත ව්‍යාපාරය ව්‍යාප්ත කරනු ලැබූ බව පැහැදිලිය.[6] ඒ අනුව ශ්‍රී ලංකාව, ස්වර්ණභූමිය, යවනලෝකය ආදී ප්‍රදේශ කරා බුදුදහම ව්‍යාප්තියටත් චිර පැවැත්ම උදෙසාත් වැදගත් පියවර ගන්නා ලදි.[7] මෙසේ වුවද කාලිංග යුද්ධයෙන් අනතුරුව යුද්ධයෙහි පවතිනු ලබන අතිශය භයංකාරභාවයත් නිරර්ථකභාවය වැටහී ගිය හෙයින් ධර්ම විජය ප්‍රතිපත්තියෙහි වටිනාකම අශෝකයන් විසින් ස්වකීය අංක 13 දරණ ලිපියෙහි දක්වා ඇත.[8] එකී සාධකයනට අනුව අභිලේඛනයන්හි අන්තර්ගත තොරතුරු පරීක්ෂණයට ලක්කිරීමෙන් පෙනීයනු ලබන්නේ එම සබඳතාවන්හි දේශපාලන පරමාර්ථයන් ද ගැබ් වී ඇති බවය. එනමුදු ශ්‍රී ලාංකේය සාහිත්‍යය මූලාශ්‍රයන්හි අශෝක තිස්ස සබඳතාවය ආගමික පාර්ශ්වයට වැඩි අවධානයක් යොමුකොට දක්වා තිබෙන බව පෙනීයයි.

ක්‍රි.පූ. 4 වැනි සියවසේ අවසාන කාලපරිච්ඡේදයේ දී මෞර්ය පාලක චන්ද්‍රගුප්ත මෞර්ය යටතේ ඇෆ්ගනිස්ථානයේ සිට මයිසූර් තෙක් ව්‍යාප්තව තිබුණු විශාල අධිරාජ්‍යයක් සංවිධානය[9] වී තිබුණු අතර බින්දුසාර නම් ඔහුගේ පුත්‍රයා තම පියාගෙන් ලැබුණු අධිරාජ්‍යය රැකගත්තා වියහැකි අතර ඇතැම් විට තවදුරටත් ව්‍යාප්ත කරන්නට ද ඇත. ඒ අනුව අශෝකයන් ද එම ක්‍රියාමාර්ගයම ක්‍රියාවට නන්වන්නට ඇත. දෙවනපිය[10] යන අශෝකයන් විසින් දැරූ විරුදය මෙරට මුල් පාලකයන් ද භාවිත කළ අතර සාහිත්‍යය මූලාශ්‍රයන්හි[11] එම විරුදය පළමුවෙන්ම තිස්ස රජු විසින් දැරූ බව සඳහන් වෙතත් ''උතිමහරකඩ'' නමින් සඳහන් වෙන දෙවනපැතිස්ගේ සහෝදර උත්තියත් දැරූ බව අභිලේඛනයක් මඟින් පෙනීයයි.[12] තවද පාලකයන් රැසක් මේ විරුදය දරා තිබේ.

දෙවනපැතිස් නම් අනුරාධපුරය පාලනය කළ පාලකයා

විසින් ''දෙවනපිය'' යන විරුදය භාවිත කළේ කුමන කාරණයක් පදනම් කරගෙන ද යන්න වැදගත්ය. ඒ අනුව දෙවනපෑතිස් මෞර්ය පාලකයා සමඟ සබඳතාවයක් ගොඩනගා ගැනීමෙන් තමාට තත්කාලීන දේශපාලන තත්ත්වය සුභදායි කරගැනීමටත් එහිදී තම පක්ෂපාතිත්වය දක්වා තම පාලන ඒකකය හා තම නායකත්වය වඩාත් ශක්තිමත් කරගැනීමටත් ඔහු මෞර්ය පාලකයා සමඟ සබඳතාවයක් ගොඩනගා ගන්නට උත්සාහ කරන්න ඇතැයි සිතීමට හැකිය. එය පෙරදිග ලෝකයේ සිටි ප්‍රබල අධිරාජයෙකු සමඟ සබඳතාවයත් ඔහුගේ විරුදය භාවිත කරමින් ද තම පාලන ඒකකය දේශපාලනිකව ඉදිරියට ගෙන ඒ මෙහිලා කළ එක් උපක්‍රමයකි.[13] මෙරටට මෞර්ය සම්ප්‍රදායේ[14] ආභාසය රාජ්‍යය පාලනය සඳහා ක්‍රි.පූ. 3 වැනි සියවසේ එනම් දෙවනපෑතිස් කළ සිටම තිබූ හෙයින් ''දෙවනපිය'' විරුදය එයට ගරු කිරීමක්[15] ලෙස භාවිත කරන්නට ඇත.

වංසකථා හා සමන්තපාසාදිකාව ආදී සාහිත්‍යය මූලාශ්‍රවල එන දේවානම්පිය තිස්ස අශෝක වෙත යැව් දූත ගමන[16] හුදෙක් මිත්‍රත්වය ප්‍රකාශ කිරීමක් ද නැතහොත් දේශපාලනමය අභිප්‍රායන් උදෙසා ද යන්න විද්වතුන් අතර සාකච්ඡාවට බඳුන්ව ඇත. ඒ අනුව එයින් අශෝකයන් දැරූ රාජකීය විරුදය සහ සම්මාන සහිතව පවරා දෙන ලෙස ඉල්ලූ බව පරණවිතාන[17] සඳහන් කළත් එච්. ඩබ්. කොඩ්රිංග්ටන් අශෝක තම රටේ දී ලබා සිටි තත්ත්වය මත ස්වකීය බලය තහවුරු කරගැනීමේ පරමාර්ථයෙන් යැව් දූත ගමනක් ලෙසින් දක්වයි.[18] මේ සම්බන්ධයෙන් අවධානයට ලක්කරන එන්. ඒ. ජේක්මන් තත්කාලීනව අශෝකයන් විසින් ඉන්දියාවේ දකුණු ප්‍රදේශ තෙක් ස්වකීය අණසක ව්‍යාප්ත කර තිබූ හෙයින් තම පක්ෂපාතීත්වය දැක්වීම උදෙසා යැවූ දූත ගමනක් ලෙස පවසයි.[19] ඒ අනුව සාහිත්‍යය පාර්ශ්වය මෙන්ම විචාරක මත යන ද්විත්වය මත මෙහි දේශපාලන පරමාර්ථයක් අන්තර්ගත බව මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමියෝ පවසති.[20] එම අදහස තවදුරටත් සනාථ වනු ලබන්නේ දෙවනපෑතිස් විසින් නොයෙකුත් අගනා මුතු වර්ග මෙන්ම රුවන් වර්ග ආදිය අශෝකයන් වෙත යැවීමෙන්[21] ද අශෝකයන් ද රාජකීය නියෝජිතයන් වූ අරිට්ඨ හට සෙනවිරත් තනතුරු ද බ්‍රාහ්මණයා හට පුරෝහිත තනතුරු ද ඇමතියා හට දණ්ඩනායක තනතුරු ද සිටු තනතුර ගණකයා හටත් තම රාජ්‍යයෙහි දීම ලබාදීම[22] සහ ඡත්‍රය, චාමරය, ඛඩ්ගය, මෞලිය,

රුවන් මිරිවැඩි සඟලය යන අභිෂේකය පිණිස අවශ්‍ය අභිෂේක උපකරණ එවීමත් යන කරුණු පදනම් කරගෙනය.[23]

පරිපාලනමය තනතුරු ප්‍රදානයත් අභිෂේක උපකරණ එවීමත් මත මෙහිදී ගැටළු සහගත තත්ත්වයක් මතු කරයි. එනම් මිත්‍රත්වය ප්‍රකාශ කිරීම මත එය තහවුරු කිරීමට නියෝජිතයන් ගිය හෙයින්ය. දෙවනපෑතිස් අවධියේ රාජ්‍යාභිෂේකය සඳහන් කිරීමේ දී ඊට පෙර සිටි පාලකයන් ''නවයට්ඨී'' නම් සැරටියක් පමණක් තම රාජ්‍ය සංකේතය ලෙස භාවිත කළ අතර අභිෂේකයක් නොතිබූ දෙවනපෑතිස්ස ද ''නවයට්ඨීය'' උපයෝගී කරගෙන පාලන කටයුතු කරගෙන යන බව දූතයන් විසින් ප්‍රකාශ කළ බව වංසත්ථප්පකාසිනියේ සඳහන්ව තිබීමෙන්[24] යට කී ගැටළු සහගත තත්ත්වය මඟහැරී යනු ඇත. ඒ අනුව දෙවනපෑතිස් යැවූ දූත ගමනේ දේශපාලනික පරමාර්ථයන් තිබුණ ද මෞර්යයන් විසින් ප්‍රදානය කළ තනතුරු මෙරට පාලන තන්ත්‍රයට ඍජුවම භාවිත කළ බව[25] කීමට අපහසුය.

ධර්ම මහාමාත්‍රවරු උපයෝගී කොටගෙන සංස්කෘතික හා දේශපාලන සබඳතාවන් අශෝකයන් තිස්ස සමඟ ගොඩනගාගත් පසු එම සබඳතාවයන් නැවත දූතයන් අශෝකයන් වෙත යැවීමෙන් තහවුරු කරගන්නට ඇත. ඒ අනුව ක්‍රි. පූ. 3 වැනි සියවසේදී මෙම සබඳතාවය පැහැදිලිවම සංස්කෘතික සබඳතාවයක් ගොඩනැගීමටත් පාලන සංවිධානයක පසුබිම සැකසීම කෙරෙහි මෙන්ම රාජ්‍යයේ වර්ධනය කෙරෙහි ද බලපාන ලදි.[26]

ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසය මෙන්ම එහි සංස්කෘතිය හැඩගැසීමෙහි ලා ඉන්දියාවෙන් නොමඳ පිටිවහලක් විය. ඒ අනුව බෞද්ධාගම සේම අනෙකුත් ඉන්දීය සංස්කෘතිකාංග මේ රටේ ව්‍යාප්ත විය. විජයාගමනයට පෙර සිටත් ඊට ආසන්න කාලපරිච්ඡේදය තුළ දී දෙරට අතර වූ සබඳතාවන් මත සංස්කෘතිකාංග හුවමාරු වන්නට ඇත.

ක්‍රි. පූ. 3 වැනි සියවසෙ දී මෙරට සංස්කෘතියේ බෙහෙවින්ම වැදගත්කම සනිටුහන් කරනු ලබන්නේ බුදුදහම අශෝකයන්ගේ අනුග්‍රහය මත සිදුවීමය.[27] එහිදී වංසකතාව[28] මහින්දාගමනයට පෙර මෙරට දියුණු ආගමික තත්ත්වයකින් සාහිත්‍යයකින් අනෙකුත් දියුණු

සංස්කෘතිකාංගයන්ගෙනුත් ක්‍රමවත් පාලන රටාවකින් තොරයැයි ගෙනහැර දැක්වූවත් ඊට පෙර සිටම කිසියම් ආකාරයක දියුණු සංස්කෘතිකාංගවලින් යුක්ත බව පුරාවිද්‍යා මූලාශ්‍ර මඟින් සනාථ වේ.[29] බ්‍රාහ්මණාගම, ජෛනාගම, වෘක්ෂ වන්දනාව, යක්ෂ සහ නාග ආදී ඇදහිලි[30] මත පෙනීයන්නේ මුල් කාලපරිච්ඡේදයේ සිටම ලංකාවේ ව්‍යාප්ත වූ ආගමික විශ්වාසයන් බොහෝමයක්ම ඉන්දිය ආගමික විශ්වාසයනට සාම්‍යත්වයක් තිබෙන බවය.

ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණ පදිංචි වූවන් ක්‍රි. පූ. 5 වැනි සියවසේ සිටම දක්නට ලැබේ. සෙනරත් පරණවිතාන සඳහන් කරන්නේ ආදී සිංහලයන්ගේ මුල් බිම වූ ඉන්දියාවේ එන ආගමික විශ්වාසයන් අතර සාම්‍යත්වයක් පෙන්නුම් කරන බවක්ය.[31] මෙරට දැකිය හැකි සතරවරම් දෙවිවරුගෙන් සමන් හා උපුල්වන් යන දෙදෙනා කිසියම් වෙනසකට භාජනය වූ යම සහ වරුණ යන දෙදෙනාම බවත් අනෙක් දෙදෙනාගෙන් ස්කන්ධ කුමාරයා ඉන්ද්‍ර දේවියාගේ සේනාපතියා වන අතර කුවේරගේ සහෝදරයෙක් ලෙස විභීෂණ දක්වයි. මෙරට මුල් ජනයා රාම, කර්ණ, වාසු, දේව, ශිව ඉන්දියාවේ දී සුරා දෙවියා ලෙස සැළකූ බලදේව යනාදී දෙවිවරු ඇදහු බව අභිලේඛන සහ වෙනත් සාධකයන් මඟින් පෙනෙන අතර මෙම දෙවිවරු බ්‍රාහ්මණ යුගයේහි දී ඉන්දියාවේ දේව මණ්ඩලයට[32] අයත් වූවන්ය. එමෙන්ම අභිලේඛන හා සාහිත්‍යය මූලාශ්‍රවලට අනුව මෙරට බ්‍රාහ්මණයන් විසූ අතර අභිලේඛනවල දක්නට ලැබෙන වෙස, ශිව, නග, ඉඳ, දෙව, කදලි වැනි භාවිත කරන ලද පෞද්ගලික නාම දෙස බලනවිට ද නාග සහ දේව වැනි ආගමික මත ගරු කළ පිරිස[33] මෙකළ විසූ බවත් පැහැදිලි කරගත හැකිය.

සංස්කෘතික පාර්ශ්වය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී සාහිත්‍යය මූලාශ්‍රවලට අනුව විජයාගමනයට පෙර ගෞතම බුදුන් වහන්සේ වැඩිය බවත් පළමුවර යක්ෂයන් දමනය කිරීමටත් දෙවනවර නා රජුන් දමනය කිරීමටත් තෙවෙන වර ථූපාරාමය, කල්‍යාණී ආදි චෛත්‍යස්ථානයෙහි නිරෝධ සමාපත්තියට සම වැඳ වැඩහුන් සේක. එසේම උන්වහන්සේ මේ දිවයිනේ බුදුසසුන පිහිටන බව ද දැනසිටි බව සඳහන් වේ.[34] ඊට පෙර මෙ රටට කකුසඳ බුදුන්වහන්සේ කෝණාග මන සහ කාශ්‍යප යනාදී බුදුවරුන් ද වැඩම කොට තිබේ. කකුසඳ

බුදුන් 40000 භික්ෂූන් සමඟ මේ රටට වැඩම කරවා ලක්දිව ජනයාට පිදීමට ධබරාව (ධර්මකරකං) දී නැවැත වැඩිය බවත් එයින් සෑයක් කළ බවත් උන්වහන්සේ සමඟ පැමිණි මහාදේව නම් තෙරුණුවෝ නැවත නොගිය බව සඳහන් වේ.[35] කෝණාගමන බුදුන් දවස තිස් දහසක් භික්ෂූන් සමඟ වැඩමවා මහාසුමන නම් තෙරුන් නවතා වැඩම කර වූ බවත් උන්වහන්සේගේ කබාන (කායබන්ධනං) දී වැඩිය හෙයින් සෑයක් කරවූ බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ.[36] කාශ්‍යප බුදුන් වහන්සේ විසිදහසක් භික්ෂූන් සමඟ වැඩිය බවත් ඉන් සබ්බනන්ද හිමියන් මෙහිම වැඩසිටි අතර උන්වහන්සේගේ ''දියසළුව'' (උදකසාටිකං) තැන්පත් කොට සෑයක් තැනූ බව සඳහන් වේ.[37] ඒ අනුව සමන්තපාසාදිකාව වැනි සාහිත්‍යය මූලාශ්‍රවලට අනුව පෙනීයන්නේ බෞද්ධාගමෙහි ආරම්භය ඉතාම ඈත අවධියකට දිවෙන බවයි. නමුත් වංසකථාවල බුදුදහම සම්බන්ධයෙන් කරුණු මහින්දාගමනයට පසුව හුවා දක්වයි.

බුදුදහම ව්‍යාප්තියේ දී සංස්කෘතිකමය පාර්ශ්වය අතින් බුදුදහමට සම්බන්ධිත පූජා වස්තූන් ආදිය ජනයාට හඳුන්වාදීමට හා ඒ ආශ්‍රිත ආගමික වතාවත්වලට යොමු කිරිම බෙහෙවින්ම වැදගත් වේ. ඒ අනුව මිහිඳු හිමියන් ඇතුළු පිරිස හා රජු මැදිහත්ව ඒ සඳහා කටයුතු සංවිධානය කර මේ රටට එම පූජා වස්තූන්, වතාවත් හඳුන්වා දෙනු ලැබීය. මිහිඳු හිමියන් අශෝක වෙත සුමණ සාමණේරයන් යවා පාත්‍රය පුරවා ධාතූන්[38] ද ශක්‍රයා වෙතින් දකුණු අකුධාතුව ද ලබාගෙන මේරටට එම පූජා වස්තූන් හඳුන්වා දෙනු ලැබීය.[39] එය මහින්දාගමනයෙන් පසු ඉදිකළ ප්‍රථම ථූපය වශයෙන් සළකන ථූපාරාමය ඉදිකිරීම[40] තුළින් තවදුරටත් පැහැදිලි වේ. මෙය පූර්වාදර්ශ කොටගෙන ශ්‍රී ලංකාවේ දකුණු, නැගෙනහිර, උතුර හා වෙනත් ප්‍රදේශයන් කරා[41] විශාල ස්ථූපයන් ඉදිවීමේ සම්ප්‍රදායක් නිර්මාණය කිරීමට හැකිවිය.

සංඝමිත්තාවන් විසින් ශ්‍රී මහාබෝධි ශාඛාවත් මෙහෙණි සසුනත් ගෙන ඒම[42] මත අනුලා සහ පිරිවර පැවිදි වීමෙන් මෙරට භික්ෂුණී ශාසනය ඇරඹුණු අතර ශ්‍රී ලංකාව හා ඉන්දියාව යන දෙරට සංස්කෘතික සබඳතාවය දැඩි කිරීමට ශ්‍රී මහාබෝධි ශාඛාව ද සම්බුද්ධ ධාතු හා පාත්‍රය ද ගෙන ඒම මත සිදුවනු ලැබීය. මෙතෙක් කාලයක් අවිධිමත් ඇඳහිලි ක්‍රමවේදයක් භාවිත කළ ලක් ජනතාවට මහින්දාගමනයත් සමඟින් බුදුරජාණන් වහන්සේගේ ශාරීරික පාරිභෝගික

පූජා වස්තූන් හඳුන්වාදීම තුළ තිබුණු විශ්වාසයන්ට වඩා අර්ථාන්විත සංස්කෘතියක්[43] ලැබිණි.

මහින්දාගමනයත් සමඟින් මෙරට සාහිත්‍යාංගයන්හි වර්ධනයත්[44] ක්‍රි. පූ. 6 වැනි සියවස වැනි පැරණි කාලයට අයත් අක්ෂරයන් සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක තොරතුරු දක්නට හැකි වුවද අක්ෂර කලාවේ සීඝ්‍ර දියුණුවක් මෙන්ම රටපුරා බොහෝ සෙයින් ව්‍යාප්ත වීමක්[45] ද දක්නට ලැබේ.

ක්‍රි. පූ. තුන්වැනි සියවසට පෙර ලක්දිව ඉතාම සීඝ්‍ර වශයෙන් ගෘහනිර්මාණ, වාස්තු විද්‍යාත්මක, කාර්මික, කැටයම් යනාදියෙහි දියුණුවක් ලබා තිබූ බවක් විශ්වසනීය මූලාශ්‍ර මඟින් දක්නට නොලැබුණ ද ස්ථූපකරණය, වෙනත් කැටයම්, මූර්ති[46] ආදිය සම්බන්ධයෙන් ද මිහිඳු හිමියන් සහ සංඝමිත්තාවන් සමග ශ්‍රී ලංකාවට පැමිණි නොයෙක් පිරිස් තුළ කාර්මික, කෘෂිකාර්මික, වාස්තු විද්‍යාත්මක මෙන්ම විවිධ තාක්ෂණික පාර්ශ්වයන්හි තිබූ දැනුම මත මෙරට පෙරකී පාර්ශ්වයන්හි විශාල දියුණුවක් දක්නට ලැබේ.[47] මිහිඳු හිමියන් විසින් ශ්‍රී ලංකාවට බුදුදහමත් සමඟ මහා සභ්‍යත්වයක් ගෙන ඒම[48] තුළින් ගොඩනැගුණු සංස්කෘතික පරිසරය මෙරට සංස්කෘතියෙහි අනන්‍යතාවය[49] ඇති කිරීමෙහිලා ඍජුව බලපාන ලදි.

සංස්කෘතිකාංග ව්‍යාප්තියේ දී ප්‍රධාන සාධකයක් ලෙස වාණිජ කටයුතු මෙන්ම වාණිජ සබඳතාවයන්හි වර්ධනය ඉතාම වැදගත්ය. ඒ අනුව පුරාවිද්‍යාත්මක[50] සාධකයන් හෙවත් නෂ්ථාවශේෂයන් ශ්‍රී ලංකාවෙහි නොයෙකුත් ප්‍රදේශයන් තුළින් සොයාගත් පසු ශ්‍රී ලාංකිකයන් විසින් බොහෝ කාලපරිච්ඡේදයක සිටම විදේශයන් සමඟ එනම් ක්‍රි. පූ. 3 වැනි සියවසට පෙර සිටම වාගේ භාණ්ඩ හුවමාරු ක්‍රමයක් මෙන්ම යම්කිසි ආර්ථිකමය කටයුතු කරන්නට ඇතැයි සිතීමට ඉඩකඩ තිබේ.[51]

කෘෂිකර්මය හා වාණිජ අංශයන්හි කටයුතු දේශපාලන සංවිධානයෙහි වර්ධනය සඳහා බොහෝ සෙයින්ම බලපානු ලබන අතර එය සංස්කෘතිකාංග හුවමාරු වීමට මෙන්ම ව්‍යාප්ත වී මෙහිලා ද යහපත් පරිසරයක් ගොඩනගාලයි. ඈත අතීතයේ සිටම පෙර අපර දෙදිග වෙළඳුන් භාවිත කළ සුවිශේෂී වෙළඳ මධ්‍යස්ථානයක්

ලෙසින් ශ්‍රී ලංකාව පැවැතිණි. මෙරට නාවික මාර්ගයක පිහිටීමත් නාවික කාර්යයන් සඳහා ඉතාම සුදුසු වරායන් රාශියක් තිබීමත් නිසා විශේෂයෙන් ඉන්දියාව හා අසල්වැසි රටවලින් වෙළඳුන් පැමිණියහ. ඒ අනුව ඊසාන දිග ඉන්දියාව, වයඹ දිග ඉන්දියාව, දකුණු දිග ඉන්දියාව හා ශ්‍රී ලංකාවේ ජම්බුකෝළ, ගෝකණ්ණ හා මහාතිත්ථ යනාදී වරායන්[52] භාවිත කරමින් එකල විශාල ඉල්ලුමක් ලෝකය පුරා තිබුණු මුතු, මැණික්, ඇත් දත් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාවට වෙළඳුන් පැමිණියහ. මෙරට මුතු ,මැණික්[53] වාණිජ භාණ්ඩ අතර සුවිශේෂය. පුරාවිද්‍යා කැණීම් මඟින් විදේශ මැටි බඳුන් සහ අශ්වයන් ගැන සඳහන් තොරතුරුවලින් පෙනීයන්නේ විදේශ රටවල් සමඟ සබඳතා පවත්වාගෙන ගිය බවකි.[54]

එමනිසා ක්‍රි. පූ. 3 වැනි සියවසේ දී ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ අශෝක තිස්ස යන දෙදෙනා ගොඩනගා ගනු ලැබූ සබඳතාවයෙහි ආර්ථිකමය අදහස් ඇති ද යන්න සළකා බැලීම වැදගත්ය. දීපවංශය මහාවංසය සමන්තපාසාදිකාවිනයට්ඨකථාව ආදී මූලාශ්‍රයන්හි එන තොරතුරු අනුව ආර්ථිකය සඳහා සුවිශේෂි වැදගත් තැනක් ඇතැයි සිතිය හැක. විනයට්ඨකථාව සහ වංසකථා දී මූලාශ්‍රවලට අනුව දෙවනපෑතිස්ගේ පුණ්‍ය මහිමය නිසා රාජ්‍යයෙහි නොයෙක් ස්ථානයන්හි නොයෙක් වටිනා දෑ පහළ වූ බව සඳහන් වේ. ඒ අනුව මුහුදෙන් මුතු මැණික් සහ නොයෙකුත් වර්ගයෙහි රත්නයන් පහළ වූ බව පෙනේ.[55] ඒවා ලබාගත් රජු අශෝකයන් වෙත යැවූ බවත් සඳහන් වේ.[56] එම බණිජ ද්‍රව්‍යන්ගේ පහළවීම කෙසේවුවද ලක්දිව මෙම සම්පත් තිබූ බව පැහැදිලිය. ආර්ථිකමය පාර්ශ්වයෙන් වැදගත්කමක් දරන මුතු, මැණික් ආදී සම්පත් මෙරට තිබෙන හෙයින් දෙරට අතර සබඳතාවක් ගොඩනගාගන්නට උත්සාහ දරන්නට ඇත. එසේම ශ්‍රී ලංකාව මේ කාලය වනවිටත් ඊට පෙර සිටම වැදගත් වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් හුවමාරු වන ස්ථානයක් වන හෙයින් පෙර අපර දෙදිගම ජනයාට අවශ්‍ය වෙනත් භාණ්ඩයන් ද ශ්‍රී ලංකාවෙහි වූ හෙයින් එහි වටිනාකම තේරුම්ගත් අශෝක රජු ඒ අනුව ක්‍රියාකරන්න ඇත.

පුරාවිද්‍යාත්මක සාක්ෂිවලට අනුව ක්‍රි. පූ. 3 වැනි සියවස වනවිට ශ්‍රී ලංකාව කෘෂිකාර්මික හා තාක්ෂණික පාර්ශ්වයන්ගෙන් ඉදිරියට එමින් තිබූ සමාජයක් විය.[57] සමාජ, ආර්ථික යන අංශයන්හි

සිදු වූ වෙනස්වීම් හා එහි බලපෑම සමාජය තුළ නායකත්ව ඇතිවීමට වගේම එම නායකත්වය මුල්කරගනු ලැබූ පාලන ඒකක බිහිවීම[58] කෙරෙහිත් පදනම් වූයේය.

ක්‍රි.පූ. තෙවැනි සියවස වනවිට වාණිජ වශයෙන් වැදගත් වූ මුතු, මැණික්, ඇත්දත් ආදී වාණිජ භාණ්ඩ ලබාගත හැකි රටක් සමඟ සමීප සම්බන්ධතා පවත්නා ගැනීම මෞර්යනට ද ප්‍රයෝජනවත් වන්නට ඇති බැවින් තවදුරටත් මේ සම්බන්ධය තහවුරු කරගැනීමට සංස්කෘතික පාර්ශ්වය තුළින් අශෝකයන් උනන්දු වන්නට ඇතැයි අනුමාන කිරීමට පුළුවන.[59] ඒ අනුව මෙම සබඳතාවයන්හි යම්කිසි අයුරකින් ආර්ථිකමය පාර්ශවීය අභිලාෂයන් ද තිබූ බව පෙනීයන අතර එය සංස්කෘතික අංශයන්හි සංවර්ධනයට බලපාන ලදි.

**සමාලෝචනය**

ක්‍රි. පූ. තෙවැනි සියවසේ මෞර්ය ශ්‍රී ලංකා සබඳතා මෙරට ඉතිහාසයෙහි ඉතාමත් වැදගත් සංදිස්ථානයක් වශයෙන් සැලකිය හැකිය. එම සබඳතාව මෙරට සංස්කෘතියෙහි සමාරම්භය වශයෙන් ද ඇතැම්හු සලකති. ඉන් මෙරටට බුදුදහම මෙන්ම නව සංස්කෘතියක් ද ලැබිණි. එතුලින් වෙහෙර විහාර ඉදිකරවීම, ශ්‍රී මහාබෝධිය රෝපණය කිරීම, කලාව හා ගෘහනිර්මාණ ශිල්පය ඇතිකරවීම, සාහිත්‍ය අංශයේ ප්‍රබෝධය ආදියෙහි වර්ධනයක් ඇති විය. මහින්ද මහා තෙරුන් වහන්සේ ත්‍රිපිටකය හා අට්ඨකථා ලක්දිවට රැගෙනවිත් මෙරට වාසීන්ගේ ධර්මාවබෝධය සඳහා සිංහල භාෂාවට පරිවර්තනය කළ බවත් පැහැදිළිය. ඒ අනුව මෞර්ය ශ්‍රී ලංකා සබඳතා සිංහල සංස්කෘතියේත් ශ්‍රී ලාංකාවේ බුදුදහම ව්‍යාප්ත කිරිමෙහිලා සුවිශේෂී දායකත්වයක් සපයා තිබේ. මෙරට ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් වශයෙන් සැලකෙන මහින්දාගමනයේත් ඒ සඳහා පසුබිම සැකසුණු මෞර්ය පාලක අශෝක අධිරාජ්‍යයාගේ ඓතිහාසිකත්වය පුරාවිද්‍යාත්මක සාක්ෂි තුළින් සනාථ වීම ඉතාමත් වැදගත් වෙනවා මෙන්ම එහි නිරවද්‍යතාව පැහැදිලිවම සනාථ කරගැනීමටත් හැකි වේ. මූලාශ්‍රවල අන්තර්ගත තොරතුරු පරීක්ෂණයට ලක්කිරීමෙන් පෙනීයනු ලබන්නේ මෞර්යයන් හා ශ්‍රී ලාංකිකයන් අතර පැවැති සබඳතාවන්හි දේශපාලන හා ආර්ථික පරමාර්ථයන් ද ගැබ් වී ඇති බවය. එනමුඳු ශ්‍රී ලාංකේය සාහිත්‍යය මූලාශ්‍රයන්හි අශෝක තිස්ස

සබඳතාවය ආගමික පාර්ශ්වයට වැඩි අවධානයක් යොමුකොට දක්වා තිබෙන බව පෙනීයයි.

## ආන්තික සටහන්

1. **දීපවංශය,** සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1970, පරි. 12,; ***ඌනපූරණ සහිතො මහාවංසො,*** සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. 11, ගා. 29-.39; **සමන්තපාසාදිකාව,** සංස්. සයිමන් හේවාවිතාරන, කොළඹ: ත්‍රිපිටක ප්‍රකාශන මුද්‍රණාලය, 1900, පි. 18.
2. **Corpus Inscripationum Indicarum,**Vol. I, ed. E.Hultzch; London: Oxford University Press, 1925, pp. 7, 15.
3. **UCHC,** Vol.I, part I, 1960, p.135.
4. **Rahula,** 1993, p.10.
5. **දීප**,පරි. 8, ගා. 2, 12; **ඌපූම**, පරි.11, ගා. 19, 131, පරි. 12, ගා. 3-7, පරි.17, ගා. 11-.12.
6. **දීප**, පරි. 12, ගා. 20-.21; **ඌපූම**, පරි. 12. ගා. 20, 26, 84.
7. **දීප**, පරි. 8, **ඌපූම**, පරි. 12; සමන්න, පි. 25 -.29.
8. Thapar, 1961, p. 135.
9. R. Mookerji, **ASOKA**, London: Macmillan and Limited, 1928, p.12.
10. **CII**, Vol. I, pp.1, 2, 27, 50, 150-158,160-172.
11. **දීප**, පරි. 12. ගා. 38; ඌපූම, පරි. 13, 13, ගා. 13, සමන්ත, පි. 25, 29.
12. IC, Vol. I, Nos. 46 - 47, p.4.
13. හගුරන්කෙත ධීරානන්ද හිමි, **රාජත්වය, රාජ්‍යය සහ ආගම,** **වරකාපොල**: ආරිය ප්‍රකාශකයෝ, 2004, පි. 262.
14. **Vamsatthappakasani,** Vol. I, ed. G.p.Malalasekara, London: Pali Text Society, 1935, p. 303.
15. ධීරානන්ද හිමි, **එම**, 2004, පි. 266.
16. **සමන්ත**, පි. 29; **දීප**, පරි. 12. ගා. 1-12, 17, 27; ඌපූම, පරි. 12, ගා. 8, පරි. 13, ගා. 15.
17. S.Paranavitana, "Two Royal Titles of the Early Sinhalese – the origin of kingship in Ancient Ceylon" **JRAS (GB 81)**, 1936, p. 443.

18. H.W. Codrington, **A short History of Ceylon,** London: Macmillan & Company, 1947, p. 12.
19. S. A. Pakeman, **Ceylon,** London: Erness. Benn, 1964, p. 28.
20. ධීරානන්ද හිමි, **එම**, 2004, පි. 271.
21. **සමන්ත**, පි. 25-.29.
22. **ථූපවංස**, පරි. 11, ගා. 20, 26; සමන්ත, පි. 25 -.29.
23. **සමන්ත**, පි. 25-29.
24. Vap, Vol. I, p. 306.
25. ධීරානන්ද හිමි, **එම**, 2004 පිටු. 241-272.
26. ධීරානන්ද හිමි, **එම**, 2004, පි. 272.
27. **සමන්ත**, පි. 18 ; **දීප**, පරි. 12; **ථූපවංස**; පරි. 11. ගා. 28-.39.
28. **ථූපවංස**, පරි. 1. ගා. 19-.84, පරි. 6, පරි.7, ගා. 1-.73.
29. S. Deraniyagala, "The citadel of Annuradhapaura: Excavation in the Gedige Area", **Ancient Ceylon**, Colombo: 1972, pp. 145-180.
30. ථූපවංස, පරි. 10, ගා. 101.-102 ; Rahula, op.cit, pp.44-45 ; S. Paranavitana, "Pre-Buddhist Religions Beliefs in Ceylon" , **JRAS (GB)**, 1929, Vol. XXI, pp. 302-327.
31. **UCHC**, p. 135.
32. S. Parnavithana, "The Shine of Upulvan of Deundara", Colombo: **Ceylon** Government Archaeological Department, 1953, p.44; UCHC, p.135.
33 . ධීරානන්ද හිමි, **එම**, 2004, පි. 301.
34. ''මයි පරනිබ්බුතෙ ඉමස්මිං දිපේ සාසනං පතිට්ඨයෙ හිස්සථ''. **සමන්ත**, පි. 52.
35 . **එම**, පිටු. 50-.51.
36. **එම**, පි. 51.
37. **එම**.
38. **සමන්ත**, පි. 49.
39. **එම**, පි. 49.
40. **එම**, පි. 38.

41. ධීරානන්ද හිමි, **එම**, 2005, පි. 90.

42. **ඌපුම**, පරි. 19, ගා. 65.

43. **සමන්ත**, පිටු. 32-.34, දීප, පරි. 14, ගා. 5.-18; **ඌපුම**, පරි. 16, ගා. 2-138.

44. ඒ. වි. සුරවීර, 1963, පිටු. 35-.59; උදය මල්ලවාරච්චි, මිහිඳු සංස්කෘතිය හා මිහින්තලේ, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ, 1993, පිටු. 35-.46.

45. S. U. Deraniyagala, **The Pre History of Sri Lanka an Ecological Perspective,** Colombo: Archaeological Survey Department of Sri Lanka, 1992, p.741.

46. සූරවීර, 1963, පිටු. 63-.72.

47. **ඌපුම**, පරි. 21, ගා. 1-.2; **සමන්ත**, පි. 44; ඉන්ද්‍රකීර්ති සිරිවීර, **ශ්‍රී ලාංකේය ඉතිහාසය තරංග**, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 2004, පිටු. 19-.26.

48. Rahula,1966, p. 287.

49. ධීරානන්ද හිමි, **එම**, පි. 91.

50. Daraniyagala, 1990, pp. 211-291.

51. W.I. Siriweera, "Pre-colonial Sri Lanka's maritime commerce with special references to its ports", **Sri Lanka and the silk Road of the Sea, ed. Senanayake,** et.al; Colombo: Karunarathne & Sons, 1994, p. 125.

52. අමරදස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන, අනුරාධපුර යුගය, කොළඹ: ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1987, පිටු. 46.-48.

53. Sirima Kiribamune, "The Role of the port of city of Mahatitta (Mantota)in Trade Networks of the Indian Ocean" **SJH**,Vol. XVII,No.182,1991-1992, P.180.

54. S. Deraniyagala, "The Citadal of Anuradhapura: 1969 ; Excavation in the Gedige Area", **Ancient Ceylon**, Colombo, 1972, No. 2, pp. 140-142, 120; **IC**, Vol. I, No. 335, p. 28, 606, p.46, No. 1931 a, p. 72, No. 1558, p. 72.

55. **දීප**, පරි. 19-.23; **ඌපුම**, පරි. 11, ගා. 14.-16; **සමන්ත**, පිටු, 25 -.29.

56. **එම**.

57. ධීරානන්ද හිමි, 2005, පි. 85.

58. ධීරානන්ද හිමි, **එම**, 2004, පි. 244.

59. ධීරානන්ද හිමි, එම, 2004, පි. 303.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ඌනපූරණ සහිතො මහාවංසො,** (1959). සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩි. ගුණසේන සහ සමාගම.

**දීපවංශය,** (1970). සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

**වංසත්ථප්පකාසිනිය, මහාවංශ ටීකාව,** (1994). සිංහල අනුවාදය, අකුරැටියේ අමරවංස හිමි සහ හේමචන්ද්‍ර දිසානායක, කැළණිය: කැළණිය විශ්ව විද්‍යාලය.

එල්ලාවල, එච්. (1968). **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය,** කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

ගයිගර්, විල්හෙල්ම් (1969). **මධ්‍යකාලීන යුගයේ ලංකාවේ සංස්කෘතිය,** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධීරානන්ද හිමි, හඟුරන්කෙත (2004). **රාජත්වය, රාජ්‍යය සහ ආගම,** වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (2008). **ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය,** මහරගම: තරංජී ප්‍රින්ට්ස්.